# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.25 පැය 1645 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /838 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ සබඳතා පැවැත්වූ සැකකරුවන් දෙදෙනෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකය.**

2025.04.19 වන දින ගම්පහ පොලිස් වසමේ වතුමුල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත නිවසක් පරික්ෂා කර T-56 ගිනි අවි 02 ක්, එම පතොරම් 118 ක්, එම පතොරම් ගැබ් 03 ක්, වෑන් රථයක්, කාර් රථයක් හා ත්‍රීරෝද රථයක්ද සමඟ සැකකරුවන් හය දෙනෙකු සහ අපරාධයට සැකපිට තවත් සැකකරුවන් දෙදෙනෙකු වශයෙන් සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමශර්න සඳහා කොළඹ අපරාධ කොට්ඨාසය වෙත භාරදී තිබුණි.

මේ සම්බන්ධයෙන් තව දුරටත් පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකයේ නිලධාරින් විසින් විමශර්න සිදු කරමින් සිටියදී 2025.04.25 වන දින මිනුවන්ගොඩ විජය මාවතේ පිහිටි වෙල් යාය අසලදී සැකසහිත යතුරු පැදියක් පරීක්ෂා කර ඇති අතර එම යතුරු පැදියේ පැමිණි පුද්ගලයින් සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 440 ක් සමඟ යතුරුපැදියේ පැමිණි පුද්ගලයින් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 24 හා 35 යන වයස්වල පසුවන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් දෙදෙනා සම්බන්ධව සිදු කරන ලද වැඩිදුර විමශර්නයේදී ඉහත වතුමුල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලද T-56 ගිනි අවි 02 ස්ථානයට රැගෙනවිත් ඇත්තේ මෙම සැකකරුවන් දෙදෙනා බව අනාවරණය වී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා කොළඹ අපරාධ කොට්ඨාසය වෙත වැඩිදුර විමශර්න සඳහා භාර දී ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**